**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 29/93.**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.12.14 වැනි දින

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව / කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතික ලත් මධ්‍යම මට්ටමේ කාර්මික සේවා නිලධාරීන් දෙවැනි දෙපාර්තමේන්තු <u>පරීක්ෂණයෙන් නිදහස් කිරීම</u>**

ඉහත කාරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 1981.11.16 දිනැති අංක. 377 දරණ ආයතන චක්‍රලේඛයේ 03 වැනි ඡේදය පහත සඳහන් අයුරු සංශෝධනය කරමි.

02. මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරි සේවයේ II වැනි පන්තියේ “ආ“ ඛණ්ඩයේ සිට II වැනි පන්තියේ “අ“ ඛණ්ඩයට උසස් කරනු ලැබීම සඳහා ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය / කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය ලත් මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන්,

I. මුදල් රෙගුලාසි

II. ආයතන සංග්‍රහය

III. දෙපාර්තමේන්තු රෙගුලාසි

යන ප්‍රශ්න පත්‍ර වලින් සාමාර්ථය ලැබිය යුතුය. මොවුන් එකී විභාගයේ තාක්ෂණ ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කල හැකිය.

03. මේ අනුව අදල බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීමට කටයුතු කල මැනවි.

අ.කලේ / එම්.ඩී.ඩී. පීරිස්
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය